# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2002/68 - 2017 ජනවාරි මස 20 වැනි සිකුරාදා - 2017.01.20

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**සබරගමුව පළාතේ පළාත් සභාව**

සබරගමුව පළාත් සභාවේ 2016 අංක 06 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය

2016.12.27 දින සබරගමුව පළාතේ පළාත් සභාවේ ගරු සභාපතිතුමා විසින් සහතිකය සටහන් කරන ලදී.

2017.01.05 දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලදී.

සබරගමුව පළාතේ පළාත් සභාවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

**සබරගමුව පළාත් සභාවේ 2016 අංක 06 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය**

2016.12.01 වන දින සභා සම්මත කරන ලදුව 2017.01.05 වන දින සබරගමුව පළාතේ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුඥාව දෙන ලද සබරගමුව පළාත් සභාවේ 2016 අංක 06 දරන විසර්ජන (සංශෝධන) ප්‍රඥප්තිය නම් වූ මෙම ප්‍රඥප්තිය සියලු දෙනාගේ දැනගැනීම පිණිස මෙහි පහත පළ කරමි.

පී. එස්. ආර්. එම්. විජයරාජ,
සභා ලේකම්,
සබරගමුව පළාත් සභාව.

2017 ජනවාරි මස 18 වැනි දින,
සබරගමුව පළාත් සභාවේ දී ය.

**සබරගමුව පළාතේ පළාත් සභාව**

*2015 අංක 03 දරන විසර්ජන සංශෝධන, 2015 අංක 07 දරන හා 2016 අංක 03 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්ති වලින් සංශෝධිත 2014 අංක 10 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ*

***විසර්ජන ප්‍රඥප්තිය 2016***

***2015 වර්ෂය සඳහා***

*2015 අංක 03 දරන විසර්ජන සංශෝධන, 2015 අංක 07 දරන විසර්ජන සංශෝධන හා 2016 අංක 03 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්තිවලින් සංශෝධිත 2014 අංක 10 දරන විසර්ජන ප්‍රඥප්තිය සංශෝධනය සඳහා වූ විසර්ජන ප්‍රඥප්තිය*

01. මේ ප්‍රඥප්තිය සබරගමුව පළාතේ පළාත් සභාවේ 2016 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර, සබරගමුව පළාත් ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබුණ දින සිට ක්‍රියාත්මක වන්නේ ය.


1A - PG 3354 — 12 (2017/01)

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

02. 2015 වර්ෂයේ අංක 03 දරන විසර්ජන සංශෝධන, 2015 අංක 7 දරන විසර්ජන සංශෝධන හා 2016 අංක 03 දරන විසර්ජන සංශෝධන ප්‍රඥප්තිවලින් සංශෝධිත 2014 වර්ෂයේ අංක 10 දරන විසර්ජන ප්‍රඥප්තියෙහි දෙවන උප ලේඛනයෙහි සඳහන් 81002 හා 84002 යන අත්තිකාරම් ගිණුම්වල සීමාවන්, මෙහි පළමුවන උපලේඛනය පරිදි සංශෝධනය කරනු ලැබේ.

*පළමු උපලේඛනය*

**2015 ඇස්තමේන්තු**

**පළාත් රාජ්‍ය නිලධාරීන්ගේ අත්තිකාරම් ගිණුම් කටයුතු හා වෙනත් අත්තිකාරම් ගිණුම් කටයුතු**

| i | ii | iii | iv | v | vi | vii | viii |
|---|---|---|---|---|---|---|---|
| | *අමාත්‍යාංශ/ දෙපාර්තමේන්තු* | *විෂය අංකය* | *අත්තිකාරම් වර්ගය* | *උපරිම වියදම් සීමාව* | *අවම ලැබීම් සීමාව* | *හර ශේෂයේ උපරිම සීමාව* | *බැරකම්වල උපරිම සීමාව* |
| වෙනත් අත්තිකාරම් ගිණුම් | | | | | | | |
| 27. | ප්‍රධාන අමාත්‍යාංශය | 81002 | පරිගණක අත්තිකාරම් ගිණුම | 800,000.00 | 250,000.00 | 300,000.00 | 100,000.00 |
| 33. | අධ්‍යාපන, තොරතුරු තාක්ෂණ හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය | 84002 | මෙනේරිපිටිය අටුළුගම අධ්‍යාපන සංවර්ධන මධ්‍යස්ථාන අත්තිකාරම් ගිණුම | 6,600,000.00 | 4,000,000.00 | 500,000.00 | 100,000.00 |

02 - 303

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.